# බරක් ඔබාමා හුසේන් ඔබාමා පැරදවීම හා පඬියෝ

මෙවර ඇමරිකානු ජනාධිපතිවරණයෙන් බරක් ඔබාමා මහතා ජයගෙන ඇත. ඒ පිළිබඳ මෙරට සිටින සිංහල බෞද්ධ විරෝධීන් දැනටමත් මත ප්‍රකාශ කර ඇත. සමස්තයක් ලෙස ගතහොත් ඔවුන්ට සැමදාමත් ප්‍රශ්නය වූයේ මෙරට දේශපාලන හා රාජ්‍ය නායකත්වය සිංහල බෞද්ධයනට හිමිවීම ය. ඉන්දියාවේ සික් ජනවර්ගයට අයත් මනමෝගන් සිං මහතාට අගමැති විය හැකි නමුත් මෙරට සිංහල බෞද්ධයකු නොවන අයකුට ජනාධිපති නොවිය හැකියැයි මේ පඬියන් පැවසුවේ එමගින් ඊනියා සිංහල බෞද්ධ ආධිපත්‍යයට පහර ගසමින් ය. ඒ අතර ඔවුහු සෝනියා ගාන්ධි මහත්මියගේ ඉතාලි කතෝලික සම්භවය ද මතක් කරති.

දැන් ඔවුන්ට බරක් ඔබාමා මහතා ද ලැබී ඇත. ඇමරිකන් එක්සත් ජනපදයේ ජනාධිපති ධුරයට කළු ඇමරිකානුවකු පත්කර ගැනීම ඇමරිකාවේ ජාතිභේද, වර්ගභේද, වර්ණභේද සියල්ල අබිබවා ඊනියා ප්‍රජාතන්ත්‍රවාදය හා මානවහිතවාදය ජයගැනීමක් ලෙසත්, කළු මිනිසකු වුව ද ජනාධිපතිධුරයට පත්කරගැනීමට ඇමරිකානුවන්ට ප්‍රශ්නයක් නොවූ බවත් පඬියන්ට පැවසිය හැකි ය.

එහෙත් ඒ සම්බන්ධයෙන් ඇසිය හැකි ප්‍රශ්න කිහිපයකි. ඔබාමා මහතාගේ මව සුද්දු ඇමරිකානු කාන්තාවක වීම පසෙකලමු. එක් ප්‍රශ්නයක් වන්නේ ලින්කන් ජනාධිපතිගෙන් පසුව කළු ඇමරිකානුවකුට එරට ජනාධිපතිවීමට ඉඩ තිබුණේ ද යන්න ය. අවුරුදු එකසිය හතළිස් පහකට පමණ පෙර කළු ඇමරිකානුවකුට එරට ජනාධිපතිවීමට කිසිදු ඉඩක් නො වී ය. වහල් බවින් නෛතික ව මිදුණු පමණින් කළු ඇමරිකානුවන් ජනාධිපති පදවියට සුදුසු නො විණි. එසේ නම් ලින්කන් මහතා මියගිය 1865 අවුරුද්දේ  සිට අද දක්වා සිදු වී ඇත්තේ කුමක් ද? ඔබාමා මහතා ජනාධිපති තරගයේ ජයග්‍රහණය භාර ගනිමින් කළ කතාවේ දී ඇමරිකාවට දෙවියන්ගේ පිහිට පැතී ය. මේ දෙවියන්  ක්‍රිස්තියානි දෙවියන් මිස ඉස්ලාම් ආගමේ අල්ලා දෙවියන් නොවන බව පඬියන් හැරෙන්නට සියල්ලෝ ම දනිති. ඔහු ඇමරිකාවට තුණුරුවන්ගේ සරණ නො පැතී ය. මෙරට සර්වාගමික කැරොල් කරත්තය ඒ සම්බන්ධයෙන් කියන්නේ කුමක් ද?

ඔබාමා මහතාගේ පියා කෙන්යානු ඉස්ලාම් භක්තිකයකු විය. එබැවින් එක්තරා ආකාරයකින් ගතහොත් ඔබාමා මහතා වහළුන්ගෙන් පැවතෙන්නෙක් නො වේ. මවගේ පැත්තෙන් සළකා බැලූ විට නම් ඔබාමා මහතා වහල් හිමියන්ගෙන් පැවතෙන්නෙකි. එහෙත් අපි කලින් සඳහන් කළාක් මෙන් ඒ නො සළකමු. ජෛවීය ව වහළුන්ගෙන් පැවතෙන්නකු නොවූව ද හමේ වර්ණය අනුව ගතහොත් ඇමරිකානු ජන විඥානයේ ඔබාමා මහතා වහළුන්ගෙන් පැවතෙන්නෙකි. කෙසේ වෙතත් ඔබාමා මහතාගේ පියා ඇමරිකාවට වහළුන් ගෙනා අප්‍රිකාවෙන් පැමිණි තැනැත්තෙකි.

කෙසේ හෝ 1865 ඇමරිකානු ජනාධිපති ධුරයට සුදුසුකම් නොකී කළු ඇමරිකානුවකු 2008 දී ඇමරිකානු ජනාධිපතිවරණය දිනුවේ කෙසේ ද? මෙහි දී සමාන්තර ක්‍රියාවලි දෙකක් සිදු වී ඇත. එකක් කළු ඇමරිකානුවන් ඇමරිකන් ඇංග්ලො සැක්සන් සංස්කෘතිය වැළඳගැනීම ය. අද කළු ඇමරිකානුවා එදා අප්‍රිකාවෙන් ඇමරිකාවට ගෙන එනු ලැබූ කල්ලා නො වේ. කළු ඇමරිකානුවෝ ද අද සංස්කෘතියෙන් ඇමරිකන් ඇංග්ලො සැක්සන් සංස්කෘතියට අයත් වෙති. විශේෂයෙන් ම ඔබාමා මහතාගේ පැලැන්තියේ අය අයත්වන්නේ ඒ සංස්කෘතියට ය. කොන්ඩොලීසා රයිස් මහත්මිය ඒ සඳහා තවත් උදාහරණයකි.

ඇමරිකන් විශ්වවිද්‍යාලවල ඉගෙන ගත් කළු ඇමරිකානුවෝ බොහෝ විට ඇමරිකන් ඇංග්ලො සංස්කෘතියට අයත් වෙති. ඇමරිකාවේ ද , ලංකාවේ ද, වෙනත් රටවල ද ඇති බටහිර විශ්වවිද්‍යාල හුදෙක් දැනුම බෙදාදෙන, දැනුම නිර්මාණය කරන ආයතන නො වේ. වර්තමානයේ දී ඒවා බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ප්‍රචලිත කරන ආයතන ද වෙයි. ඔබාමා ලා රයිස් ලා ඒ විශ්වවිද්‍යාල ඔස්සේ ද ඇමරිකන් ඇංග්ලො සැක්සන් සංස්කෘතිය වැළැඳගත්තෝ වෙති. ඔවුහු හමින් පමණක් කළු වූවෝ වෙති. මැකෝලි සාමිවරයාට අවශ්‍ය වූ හමින් කළු එහෙත් අනෙක් සෑම කරුණකින් ම, සුද්දු ඉන්දියානුවන් බිහිකිරීම වලංගුවන්නේ ඉන්දියාව, ලංකාව ආදී රටවලට පමණක් නො වේ. ඒ ඇමරිකාවට ද වලංගු වෙයි. කෙටියෙන් කියතහොත් ඔබාමා මහතා කළු සුද්දෙකි. පසුගිය අවුරුදු එකසිය හතළිස් පහක පමණ කාලයෙහි කළු ඇමරිකානුවන් විශාල ප්‍රමාණයක් කළු සුද්දන් බවට පත් වී ඇත.

© Prof. Nalin De Silva

එහෙත් ඒ කාලයෙහි තවත් දෙයක් සිදුවිය. එනම් එසේ කළු සුද්දන් බවට පත්වූවන් සුදු ඇමරිකානු සමාජය විසින් පිළිගනු ලැබීම ය. එය ඇමරිකාවට පමණක් සීමා වූ දෙයක් නො වේ. යම් රටක ප්‍රධාන හෝ විශේෂිත වූ සංස්කෘතියට ඇතුල්වන්නෝ ඒ සමජය විසින් පිළිගනු ලැබෙති. බරක් ඔබාමා මහතා ද එසේ පිළිගනු ලැබූවෙක් විය. එහෙත් අමතක නොකළ යුතු කරුණක් නම් සෑපුව ම මුස්ලිම් නමක් වූ හුසේන් යන්න සහිත ව නම් ඔබාමා මහතා ඇමරිකානු සමජය විසින් නො පිළිගනු ලැබීම ය. ඔබාමා ලා දෙදෙනෙක් වෙති. එක් අයකු බරක් ඔබාමා වන අතර අනෙක් තැනැත්තා හුසේන් ඔබාමා වෙයි. මැතිවරණ ව්‍යාපාරයෙහි දී රිපබ්ලිකන් පාක්ෂිකයෝ හුසේන් ඔබාමා මහතා පෙරට ගැනීමට උත්සාහ කළහ. ඒ අතර ඩිමොක්‍රටික් පක්ෂය මෙන් ම බරක් ඔබාමා මහතා ද හුසේන් ඔබාමා මහතා අමතක කිරීමට, යටපත් කිරීමට උත්සාහ කෙළේ ය. හුසේන් ඔබාමා යම් අයුරකින් ඉදිරියට පැමිණියේ නම් ඔහු පරදිනු ඇත. එබැවින් බරක් ඔබාමා මහතා හා ඩිමොක්‍රටික් පක්ෂය පළමුවෙන් ම හුසේන් ඔබාමා මහතා යටපත්කර ඔහු පරාජය කෙළේ ය. ඒ ඉතා සියුම් ව ක්‍රියාත්මක කළ ව්‍යාපෘතියක් විය. හුසේන් මබාමාගෙ යම් පමණකින් හෝ තිබූ මුස්ලිම්කම නැත්තට ම මෙන් නැතිකිරීමට ඩිමොක්‍රටික් පක්ෂය සමත් විය. රිපබ්ලිකන් පක්ෂ ඒ මතුකළ සෑම විටක ම ඒ පරාජයකිරීමට ඩිමොක්‍රටික් පක්ෂ සමත් විය.

ඇමරිකාව කළු ජාතිකයකු ජනාධිපතිධුරයට පත්කර ගෙන ඇතැයි කීව ද සිදු වී ඇත්තේ ඇතැම් කළු නායක නායිකාවන් මුළුමනින් ම මෙන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය වැළඳ ගැනීමත් එසේ වැළඳගත්තවුන් ඇමරිකන් සුදු සමාජය විසින් පිළිගනු ලැබීමත් ය. ඇතැම් කසිකබල් තුට්ටු දෙකේ පඬියෝ සිංහල බෞද්ධයන් හා ඒ සංස්කෘතිය කෙරෙහි ඇති වෛරය කෙතරම් ද යත් මේ කරුණ අමතක කර ලංකාවේ සිංහල බෞද්ධ නොවූවකුට ජනාධිපති විය නොහැකි යැයි ප්‍රකාශ කරති. ඉතාලි කතෝලික සම්භවයක් ඇති සෝනියා ගාන්ධි මහත්මියට ඉන්දියාවේ වැදගත් තැනක් හිමිවී ඇති බව අපට කියා දෙති. පඬියන් යැවිය යුත්තේ ඇමරිකාවට, ඉන්දියාවට හා වෙනත් රටවලට ය. එහි දී ඔවුන්ට ලැබෙන තැන ගැන එවිට අවබෝධයක් ලබාගැනීමට හැකිවනු ඇත.

සෝනියා ගාන්ධි මහත්මිය අද ඉන්දියාවේ ප්‍රසිද්ධියේ ජීවත්වන්නේ හින්දු කාන්තාවක් ලෙස ය. ඇය හින්දි කතාකරයි. සාරිය අඳියි. ඉන්දියාව විසින් ඇය පිළිගනු ලබන්නේ හින්දු කතක් ලෙස මිස ඉතාලි කතෝලික ගැහැණියක ලෙස නො වේ. මනමෝහන් සිං හින්දු සංස්කෘතිය විශේෂිත සංස්කෘතිය ලෙස පිළිගන්නා අතර සෝනියා ගාන්ධි මහත්මියට ඉහළින් යෑමට උත්සාහ නො කරයි. ඉන්දියානුවන්ට තම හින්දු සංස්කෘතිය නියෝජනය කරන තැනැත්තෙකි. ඉස්ලාම් භක්තික කලාම් මහතා ජනාධිපති වුව ද ඔහුගේ හින්දුකම ඉන්දියානුවන්ට මදි විය. වැඩිකල් නොගොස් සෝනියා ගාන්ධිගේ කොංග්‍රසය ඔහු ජනාධිපතිකමෙන් ඉවත් කෙළේ ය. මේ ධර්මතාව ඉන්දියාවට , ඇමරිකාවට හා අනෙක් සියළු රටවලට පොදු ය. ඒ ඒ රටෙහි රාජ්‍ය නායකයෝ තම රටෙහි සුවිශේෂිත සංස්කෘතිය නියෝජනය කරති.

එහෙත් කසිකබල් තුට්ටු දෙකේ අසික්කිත (මොවුන්ට ඇති සංස්කෘතියක් නැත. බටහිරයන්ට හා ඔවුන්ගේ දැනුමට වහල්කම් කිරීම හැරෙන්නට මොවුන් දන්නා ඉටගෙඩියක් නැත) පඬියන්ට අනුව ලංකාවේ එසේ නොවිය යුතු ය. ඔවුන් කියන්නේ ඔවුන් වැනි හා වෙනත් අවජාතකයන්ට වුව ද ලංකාවේ රාජ්‍ය නායකයකු වීමට ඉඩ තිබිය යුතු බවත් ඒ රාජ්‍ය නායකයාට ලෝකයේ ඕනෑම තැනකට ගොස් සිංහල බෞද්ධ සංස්කෘතිය හැරෙන්නට වෙනත් සංස්කෘතියක් නියෝජනය කිරීමට ඉඩ දිය යුතු බවත් ය. එහෙත් ඔවුන්ගේ ශුද්ධභූමි වූ එක ම රටකවත් එවැන්නක් සිදු නො වේ. හුසේන් ඔබාමා පරදවා බරක් ඔබාමා ජයගත් බව ජඩමාධ්‍යකරුවන්ගේ පිහිටෙන් පොරවල් බවට පත්වී ඇති මේ තකතීරුවන්ට නොපෙනේ නම් කළ යුත්තේ ඔවුන් ඇමරිකාවට යැවීම පමණකි. එවිට ඔවුන් හමුවීමට එහි කිසිම ජනමාධ්‍යවේදියකු නොපැමිණෙනු ඇත. පඬියන් කුමක් කීව ද ලංකාවේ රාජ්‍ය නායකත්වය ලැබිය යුත්තේ සිංහල බෞද්ධ සංස්කෘතියේ සුවිශේෂත්වය පිළිගන්නා වූ ද ඒ සංස්කෘතිය නියෝජනය කළ හැකි වූ ද පුද්ගලයෙකි. ගැමුණු රජුගේ කාලයේ සිට අපි ඒ පිළිපදිමු. නුවර යුගයේ නායක්කාර රජවරු බෞද්ධ වූයේ ද ඒ පදනමිනි. පඬියන්ට මේ නොතේරේ නම් ඇමරිකාවේ හා ඉන්දියාවේ රාජ්‍යනායකයන් තෝරාගැනීම පිළිබඳ ව බරක් ඔබාමා මහතාගෙන් හා සෝනියා ගාන්ධි මැතිණියගෙන් තැපැල් මගින් ඉගෙන ගත හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva